# තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින් හෙළිවන ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයෙහි ස්වරූපය

*ජේ.පි.ඊ.එස්. ජයසූරිය [1]*

ශ්‍රී ලාංකේය අතීතය විවරණය කරන මූලාශ්‍රයක් වසයෙන් සැලකිය යුතු දායකත්වයක් සපයන ශිලාලේඛනයන් හි ලාංකේය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන් හි ඓතිහාසික තොරතුරු අන්තර්ගත ය. මූලාශ්‍රයගත සාධක මගින් කාන්තාවන් ඉහත කී විවිධ ක්ෂේත්‍ර තුළ සක්‍රීය දායකත්වයක් සැපයූ ආකාරය හඳුනාගත හැකි වේ. ශිලාලේඛන සාධක ඇසුරින් අනුරාධපුර යුගයේ කාන්තාව ඉටු කළ කාර්යයන්, ආගමික කටයුතු උදෙසා ඔවුන්ගේ දායකත්වය කෙසේ ද යන්න පර්යේෂණ ගැටලුව කරගනිමින් සිදු කර ඇති මෙම පර්යේෂණයේ අරමුණ, ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය ශිලාලේඛන සාධක ඇසුරින් අනාවරණය වන්නේ කෙසේදැයි විශ්ලේෂණය කිරීම ය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර එහි දී පුස්තකාල අධ්‍යයන සහ විද්‍යුත් මාධ්‍ය භාවිතය සිදු විය. විශේෂයෙන් අභිලේඛන සංග්‍රහය ග්‍රන්ථමාලාව පරිශීලනය කරනු ලැබී ය. නීලගිරි ගිරිලිපි අංක 01, අංක 02 දරණ කරදියනාරු ශිලාලේඛනය, දීඝවාපී පුදබිමෙන් හමුවන පැරණි ශිලාලේඛන අංක 4634 පුවරු ලිපිය, ගල්වැව ගිරිලිපිය, බම්බුකුලියවත්ත ශිලාලේඛනය, අභයගිරි දීඝපාෂාණ ලෙන ඉදිරිපිට දිගල්ලෙන් ගිරිලිපිය සහ වෙහෙරගල ආරණ්‍යය සේනාසන ගිරිලිපිය ආදී තෝරාගත් ශිලාලේඛන කිහිපයක් ඇසුරින් ආගමික කටයුතු උදෙසා කාන්තාවගේ දායකත්වයෙහි ස්වරූපය විශ්ලේෂණය කරන ලදී. ශිලාලේඛනයන් හි බහුල වසයෙන් සඳහන් වන්නේ ලෙන් පූජා කිරීම සම්බන්ධයෙන් වන අතර පර්යේෂණයට සම්බන්ධව තෝරාගත් මෙම ශිලාලේඛනයන් හි විවිධත්වයකින් කරුණු අනාවරණය කරයි. උපයාගත් ධනය, හිමිකාරීත්වයක් තිබූ වැව් සහ ඒවායේ බදු ආගමික ස්ථාන සහ ආගමික කටයුතු උදෙසා ප්‍රදානය, ලෙන් පූජා කිරීම පමණක් නොව සලපතලමළුවට පූජා කරන ලද පාෂාණ පුවරු ආදියෙහි නම් සටහන් කරවීම, ස්තූප ඉදිකරවීම, වෙහෙර විහාරස්ථානවලට පූජා කිරීම උදෙසා පහන් ආදිය කරවා ඒවාට කරන ලද ප්‍රදානයන් පිලිබඳ ව ආවරණය වේ. ඒ අනුව අතීත ලාංකේය කාන්තාව බෞද්ධාගමික වෙහෙර විහාරස්ථාන සමග පැවැත්වූ ආගමික සබඳතා සහ දායකත්වයෙහි ස්වරූපය අනාවරණය වන අතර තවදුරටත් දේපළ හිමිකාරීත්වය, තනතුරු, සමාජ භූමිකාව, පරිපාලන කටයුතු පමණක් නොව ස්වාධීනත්වයකින් කටයුතු කළ බව ත්, ධනවත් සහ උත්සාහයෙන් මුදල් උපයාගත් කාන්තාවන් සිටි බව ත්, අතීත ලාංකීය කාන්තාව තම ගෘහයට පමණක් සීමා නොවී ආගමික කටයුතුවලට සක්‍රීය දායකත්වයක් සපයමින් පුණ්‍ය කටයුතුවල නිරත වූ බැව් පර්යේෂණ කරුණු මගින් පසක් වේ. පර්යේෂණයෙන් අනාවරණය කරගන්නා ලද කරුණු අනුව ඉහත කී ශිලාලේඛන කිහිපය ඇසුරින් හෙළිවන ආගමික කටයුතු උදෙසා අනුරාධපුර යුගයේ කාන්තාවගේ දායකත්වයේ ස්වරූපය විවිධත්වයකින් යුතුව අනාවරණය වේ.

***ප්‍රමුඛ පද:*** අනුරාධපුර, ආගමික, ලාංකේය කාන්තාව, ශිලා ලේඛන

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. erandathi.18271@uhss.ruh.ac.lk